**රාජ්‍ය භාෂා කොමිෂන් සභාව - 2016**

**----------------------------------**

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 17(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)සී වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.12,604,490 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය 2017 මාර්තු 17 දිනට පෙර නිමකර සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2017 ජුනි 20 දින වන විටත් සමීක්ෂණ කටයුතු නිමකර නොතිබුණි. එම වාර්තාව ඉදිරියේදී ඉදිරිපත් කරන බව සභාපතිවරයා විසින් 2017 මැයි 26 දින දන්වා තිබුණි. |
| (ආ) | 1981 අංක 28 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 1982 අංක 03 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනත | සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවීම ඊළඟ මාසයේ 30 දිනට පෙර කළ යුතු වුවත්, 2016 වර්ෂයේ මාස 04 ක දායක මුදල් ගෙවීමේදී මාස 01 ක සිට මාස 05 ක් දක්වා කාලපරාසයක ප්‍රමාදයක් සහිතව ගෙවා තිබීම හේතුවෙන් රු.243,453 ක අධිභාරයක් ගෙවීමට සිදුවන බව නිරීක්ෂණය විය. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,705,554 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.820,359 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලය රු.3,525,913 ක පිරිහීමක් වී තිබුණි. පුනරාවර්තන ප්‍රදාන රු.1,690,000 කින් අඩුවීම හා වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ රු. 2,364,250 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු.4,707,830 ක් වූ ඌනතාවය 2013 වර්ෂයේ සිට ක්‍රමිකව අඩුවෙමින් 2015 වර්ෂයේදී රු.820,359 ක අතිරික්තයක් වී තිබුණද, නැවත 2016 වර්ෂයේදී රු.2,705,554 ක ඌනතාවයක් බවට පත්වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී 2012 වර්ෂයේදී රු.4,376,484 ක් වූ දායකත්වය 2015 වර්ෂයේදී රු.17,670,540 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වුවද 2016 වර්ෂයේදී එය රු.14,461,845 ක් දක්වා අඩු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 6 වන වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ අරමුණු වන්නේ රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳ ප්‍රතිපත්තිමය මූලධර්ම නිර්දේශ කිරීම සහ අධීක්ෂණය කිරීම, භාෂා භාවිතය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV ඡේදයට අනුකූලව සිදුවන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම, රාජ්‍ය භාෂා ඇගයීම දිරිගැන්වීම හා භාෂා භාවිතය සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි සඳහා විමර්ශන පැවැත්වීම සහ ප්‍රතිකර්ම යෙදීම වේ.

## 4.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

අලෙවි කිරීම සඳහා 2012 වර්ෂයටත් පෙර සිට මුද්‍රණය කර ජංගම වත්කම් ලෙස ගිණුම්වල දක්වා තිබූ රු.838,940 ක් වූ පොත් තොගය අලෙවි කරගත නොහැකි වී තිබුණි. එසේ වුවද, රු. 79,675 ක් වටිනා පොත් භාෂා නව වැඩසටහන්වලදී නොමිලේ බෙදා හැරීමට කටයුතු කර තිබූ අතර, ඉතිරි පොත් තොගය අනාරක්ෂිත ලෙස අබිලි භාණ්ඩ සමඟ ගොඩගසා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 නොවිසඳී ඇති විගණන ඡේද

2015 වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී රු.43,024 ක් වැය කර ගිණුම් කටයුතු කරගෙන යාම සඳහා මෘදුකාංගයක් මිලදී ගෙන තිබුණද , එය 2017 මාර්තු 31 දින දක්වාම ප්‍රයෝජනයට ගෙන නොතිබීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලද අතර වර්ෂයට අදාල වියදම හඳුනා නොගැනීම, නිවැරදි ගිණුම්වලට වියදම් සටහන් නොකිරීම, ලියන ලද චෙක්පත් භාර නොදී ලඟ තබාගැනීම, පාරිතෝෂික නිවැරදිව ගණනය නොකිරීම, ජර්නල් සටහන් සඳහා ජර්නල් වවුචර් නොයෙදීම ආදී ගිණුම් තැබීමේ දෝෂ බහුලව පැවතීම හේතුවෙන් ගිණුම්කරණය පිළිබඳ විශේෂ අවධානයක් යොමු විය යුතුය.